ආරක්ෂක අමාත්‍යාංශය

ආරක්ෂක අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ තෙදින නිල සංචාරයක නිරත වේ

ආරක්ෂක අමාත්‍ය ශ්‍රී රාජ්නාත් සිං මැතිතුමා 2026 සැප්තැම්බර් 08 සිට 10 වැනි දින දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වනු ඇත. සංචාරය අතරතුරදී, ආරක්ෂක අමාත්‍යතුමා විවිධ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නායකත්වය සමඟ සාකච්ඡා පවත්වනු ඇති අතර කොළඹ සිටින ඉන්දීය ඩයස්පෝරාව සමඟ නියැළෙනු ඇත. එතුමා සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ඉහළ පෙළේ දූත පිරිසක් ද සංචාරයට එක් වනු ඇත.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරු ශිෂ්ටාචාරමය සබඳතා මෙන්ම කලාපීය සුරක්ෂිතතාවය, ආරක්ෂාව, ආර්ථික සහ වෙළෙඳ සහයෝගීතාවය සහ දෙරට ජනතාව අතර ශක්තිමත් සබඳතා මත පදනම් වූ බහුවිධ හවුල්කාරිත්වයක් පවතී. ඉන්දියාව ආර්ථික අබර්දය අතරතුර ශ්‍රී ලංකාවට සහය ලබා දීම සහ 2025 වසරේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව පළමුවෙන් ප්‍රතිචාර දැක්වූ රටක් ලෙස සහයෝගය ලබා දීම තුළින් ද්විපාශ්ර්වික සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් විය. ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ යන ප්‍රතිපත්තිය සහ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ මහාසාගර් (MAHASAGAR) යන දැක්ම සඳහා ඉන්දියාවේ කැපවීම සහ සැලකිල්ල මේ තුළින් අවධාරණය කෙරිණ.

ආරක්ෂක අමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය ශක්තිමත් සමුද්‍රීය සහ ආරක්ෂක හවුල්කාරිත්වයක් ඇතුළු අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායි අංශයන්හි ශක්තිමත් සහ මිත්‍රශීලි ද්විපාශ්ර්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

****